---

**රාජාංගනය ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 21 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 16 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 06 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති රාජාංගනය ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ලිපිද්‍රව්‍ය තොගයේ වටිනාකම වූ රු.95,385 ක් ඉතිරි තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබුණි.

(ආ). ලැබිය යුතු මුද්දර ගාස්තු රු.300,000 ක් සහ ගෙවිය යුතු විගණන ගාස්තු රු.75,000 ක් සාවද්‍ය අයුරින් වියදම් ගිණුම්වලට පිළිවෙලින් හර හා බැර කිරීම හේතුවෙන් වියදම් රු.225,000 වැඩියෙන්ද වගකීම් රු.75,000 කින් හා ආදායම් ණයගැතියෝ රු.300,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ). හිඟ උසාවි දඩ ලැබීම් රු.1,369,000 ක් සමාලෝචිත වර්ෂයේ ලැබීම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම් සහ ආදායම් ණය ගැතියෝ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ). එකතුව රු.142,037 ක්වූ පුනරාවර්තන වියදම් ස්ථාවර වත්කම් වශයෙන් ගිණුම්ගත කිරීම නිසා එම ප්‍රමාණයෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදයමින් දායකවීමේ ගිණුම් වැඩියෙන්ද, පුනරාවර්තන වියදම් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඉ). රු.538,664 ක් අතැති තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද ඒවා භෞතිකව සභාව සතුව නොපැවතුණි.

(ඊ). දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය වාරික වශයෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.201,302 ක් පොලී වියදම් ලෙස දැක්වීම නිසා වර්ෂයේ වියදම් සහ ණය ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ). ශේෂ පත්‍රයේ මුළු වත්කම් වල එකතුව මුළු වගකීම් වල එකතුවට වඩා රු.991,227 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර ශේෂ පිරික්සුමේ දක්වා තිබුණු ආදායම් විෂයයන් 05 ක එකතුව රු.1,024,114 ක්වූ ලැබිය යුතු ශේෂ හා රු.32,507 ක තැන්පත් ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 1.3.2 **නොසැසඳු ගිණුම්**

ගිණුම් විෂයයන් 06 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛණවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් පැවතුණි.

### **1.3.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

සභාව සඳහා පිළිගත් ගිණුම් ක්‍රමය අනුව ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය සහ ස්ථාවර වත්කම් ගිණුම්වල ශේෂ එකතුව සමාන විය යුතු වුවත් එකී ගිණුම් දෙක අතර රු.646,376 ක වෙනසක් පැවතුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව වූ රු. 21,180,817 ක්වූ ගිණුම් විෂයයන් 13 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.511,065 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,462,778 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන ප්‍රකාරව වෙළෙඳ බලපත්‍ර ගාස්තුවෙන් සියයට 10 ක මුද්දර ගාස්තුව වූ රු.45,691 ක් අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ). ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී, අදාල භාණ්ඩ ගිවිසුම් ප්‍රකාරව නියමිත ගුණාත්වයෙන් ගබඩාවට ලැබුණු බවට ගබඩා භාර නිලධාරී විසින් ලබාදිය යුතු සහතිකය අවස්ථා 14 කදී එකතුව රු.328,429 ක්වූ භාණ්ඩ මිලදී ගැනීම් සඳහා ලබාදී නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i). | වරිපනම් බදු | 02 | 20 | - |
| (ii). | බදු කුලී | 2,780 | 3,270 | 711 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 901 | 457 | 310 |
| (iv). | වෙනත් ආදායම් | - | 2,282 | 1,778 |

### 2.3.2 බදුකුලී

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(i) වගන්තිය ප්‍රකාරව රු.282,950 ක්වූ හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වසර 20කට පමණ පෙර සිදුකරන ලද තක්සේරුව පදනම් කරගෙන කඩකුලී අයකර තිබුණි.

### 2.3.3 බලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව වෙළඳ ව්‍යාපාර වලින් අයකරනු ලබන ගාස්තු සංශෝධනය කර නොතිබුණි.

### 2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු |
|---|---|---|
| (i). | උසාවි දඩ | 1,477,796 |
| (ii). | මුද්දර ගාස්තු | 300,000 |

**2.4 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්**

**-----------------------------------------------------**

උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2008 වර්ෂයේදී ලබාදී තිබුණු වටිනාකම රු.1,743,905 ක්වූ සහල්පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන කට්ටලය සහ අත්ට්‍රැක්ටර් 02 ක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රියව පැවතුණි.

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

-------------------------------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය ප්‍රකාරව, උත්සව සඳහා දරන ලද රු.25,320 ක්වූ වියදම් සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**2.6 කොන්ත්‍රාත් පරිපාලනය**

**---------------------------**

**(අ).** පිරිවැය, එකතුව රු.4,121,411 ක්වූ කර්මාන්ත 05 ක් වෙනුවෙන් පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන සහතික ලබා ගැනීමෙන් තොරව ගෙවීම් කර තිබුණි.

**(ආ).** පිරිවැය, එකතුව රු.2,552,762 ක්වූ කර්මාන්ත 03 ක් වෙනුවෙන් තත්ත්ව පාලන වාර්තා අසමත්ව තිබියදිත් එය නොසලකා ගෙවීම් කර තිබුණි.

**(ඇ).** පිරිවැය, එකතුව රු.6,664,138 ක්වූ කර්මාන්ත 11 ක ගිවිසුම් පරිදි වැඩ නිම කළ යුතු දිනය හා වැඩ නිම කළ දිනය, අවිධිමත් ලෙස වෙනස් කර තිබුණි. එම හේතුව නිසා ගිවිසුම් කාලය තුල නිම කර නොතිබුණු කර්මාන්ත සහ ඒ වෙනුවෙන් අයවිය යුතු ප්‍රමාද ගාස්තු නිශ්චය කර ගැනීමට නොහැකි වී තිබුණි.

**(ඈ).** පිරිවැය, එකතුව රු. 6,183,955 ක්වූ කර්මාන්ත 16 ක් වැඩ අවසන් කිරීමේ නිශ්චිත දිනයක් වැඩ අවසන් කිරිමේ වාර්තාවේ නොමැතිවීම හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාද ගාස්තු අය කිරීමට නොහැකි වී තිබුණි.

**(ඉ).** රු.3,800,000 ක්වූ කර්මාන්ත 03 ක් ගිවිසුම් කාලය තුල වැඩ අවසන් නොකිරීම මත අයකළ යුතු ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

**2.7 මෙහෙයුම් අකාර්ක්ෂමතා**

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) වෙළඳ සංකීර්ණයක කඩකාමර 34 ක නිත්‍යානුකූල අයිතිය සභාවට ලබා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් කුලී අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ). සභාවට අයත් කඩකාමර කුලියට දීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර නොතිබුණි.

(ඇ). වෙළඳ බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් සෑම වර්ෂයක් පාසාම සමික්ෂණය නොකිරීම හේතුවෙන් සිල්ලර වෙළඳ ව්‍යාපාර වලින් පමණක් රු.50,050 ක වෙළඳ ගාස්තු ආදායමක් අහිමි වී තිබුණි.

(ඈ). ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව 2012 දෙසැම්බර් 31 දිනට සේවය අත්හැර ගිය, මියගිය, විශ්‍රාම ගිය හා ස්ථාන මාරුවූ සේවකයන් 14 දෙනෙකුගෙන් එකතුව රු.130,867 ක්වූ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ). අභ්‍යන්තර පාලනය.
(ඇ). ආදායම් පරිපාලනය.
(ඈ). වත්කම් කළමනාකරණය
(ඉ). ණයගැති හා ණයහිමි පාලනය